රුහුණ විශ්වවිද්‍යාලය

## 2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි - 3000 ස්ථලය
## දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

## SLS 3203- සිංහල ගද්‍ය සාහිත්‍ය II

<u>පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

1. I. පහත සඳහන් ගද්‍ය පාඨ වත්මන් ලිහිල් බසින් ලියන්න.

   II. අංකිත පදවලට විවරණ සපයන්න.

(අ) එ කල්හි අඟුල්මල් මහතෙරහු නොපමා වැ මහණුවම් කොටැ රාත් වූහ. මහතෙරුන් කෙණෙසි අහර සිඟන්නට නුවර වන් කල්හි කපුටු බලු ආදීන් නෙරනා සඳහා වටා හීසනක් පමණ තන්හි යම් කවර දිශාභාගයෙකින් දමා-ලූ <u>දුඩු සහණ හකුරු</u> අවුත් මහතෙරුන් මැ වෙරැ හෙයි. ඔහු මහසම් සිඳී ඇට දක්වා බුන් ඉසින් ලෙ වගුරුවමින් බුන් පා ඇති වැ හිණැ හිරුණු සිවුරු ඇති වැ බුදුන් කරා ගියාහැ. බුදුහු ඔවුන් දැකැ "බ්‍රාහ්මණය, අධිවාසනා කරා. බ්‍රාහ්මණය, අධිවාසනා කරා. යම් කමක්හු ගෙ විපාකයෙන් සසරැ සිටිය හොත් නොඑක් වා දහස් සුවහස් නිරයැ පස්හි, එ කම්හු ගෙ විපාක තො මෙ අත්බැවැ විළිහි" වදළො.

අමාවතුර, කෝදගොඩ කදණාලෝක (සංස්.) (පිටුව 141)



217

(ආ) සියලු මනුෂ්‍යයෝ සේමසේම තැන මැසිමත්තෙහි මැසිබදිමින්, සඳලු සියදහස් පුරා නැඟෙමින්, <u>පිටිසේනන්හි</u> අතුරු සිදුරු නැති වැ හිඳිමින්, මහරුක් උඩට නැඟෙමින්, පවුරුපදනම් පිටට නැඟෙමින්, මහා ප්‍රාසාද බිඳී නැමී යන පරිද්දෙන් සමහරමැසි බිඳී යන පරිද්දෙන් පිරී ගොස් දුපුතුන් කර හිඳුවා නොයෙක් කුහුලින් සිටගත්හ. මැසි බඳනට ශක්ති නැත්තෝ මැසි ඇත්තාවුන්ට මිලදෙමින් ඇඟිලි කට ලා වදිමින් පිරවුළු මැස්සෙහි සිටගත්හ. 'ඒ මහැත්හු හරිති! යන විථිය සොඩාපුවා සේ හැම මිනිස්සු මැ නැති වැ ගියහ. නොයෙක් පායිනින් සැරැහී නන්වෙසතුරු තිර බන්ද ආප්ත ගැනු තන්හි තන්හි උඩු මහල්හි සිටගත්හ. රජගහනුවර උඩුඅහස්හි සිතියම්කල බිතක් සේ අනන්තාපයර්‍යන්තදෙවතාවෝ සිටගත්හ. සියලු නුවර යුගාන්තවාතයෙන් ඇලැළීගිය සුවාසුදහසක් යොදුන් මහාසාගරය සේ ඇලැළීගියේ යැ. සප්තකුල පර්වතයන් මුලින් ඉපිරැ නැගෙන කොලාහලයක් සේ එකකොලාහල වැ ගියේයැ. 'තව කල්යේ නු' යි නො සිතූ කෙනෙක් නැත; 'අද නො වඩනා දැ' වනැ' යි නො සිතූ කෙනෙක් නැත.

**බුත්සරණ, ලබුගම ලංකානන්ද (සංස්.), (පිටුව 68)**

(ඇ) 'චූල්ලතිස්ස තෙරුන්වහන්සේ නම් ශුද්ධොදන රජ්ජුරුවන්ගේ නැගණි කෙනකුන්ගේ පුතණුවන්වහන්සේය. ඔබ වැළිත් ගොයම් කළමනා වක තබාපියා කල් පසුකොට කරන ගොයමක්සේ පිළිවෙත් පිරිමටයෝගපවූ බාල අවස්ථාව ගිහි ගෙයිම රඳා වැඩිමාලු කල මහණුව රූක්ෂ ප්‍රතිපත්ති නැමැති රළුපරළු දෙය හැර බුදුන්ට උපන් මියුරු ආහාර සුවසේ වළඳා පිළිවෙතින් සින්වුවත් මසින් ලෙයින් මහත්ව ඉසත් බඩත් මහත් හෙයින් චූල්ලතිස්ස තෙරුන්වහන්සේ යයි ප්‍රසිද්ධව මටසිලුටුවූ සින් සිවුරු වැළඳ පියා ආඪ්‍ය තරම් හහවනු නිසා විහාර මධ්‍යයෙහි <u>බොහෝ තැන් රැස්වනු</u> හෙයින් උස්ව තිබෙන හස්නකට නැගිපියා බොහෝසේ හිඳිනා සේක.'

(සද්ධර්මරත්නාවලිය. කිරිඇල්ලේ ඥාණවිමල නාහිමි (සංස්:) චූල්ලතිස්ස වස්තුව)

(ඇ) 'දානව රාක්ෂසයෙක් ගුවනින් යනුයේ පවනඹලරන්ලියට නිගාදුන් තුනු සිරින් වොරදනා එලඳ තුනුසිරි දැක ඇ කෙරෙහි පිළිබඳ සිත් ඇති රාක්ෂයයා මෙසේ කියේ ය. <u>හැසි සිටිනා වූ කරභ ප්‍රදේශයන්</u> ඇති කරපරිචිත මධ්‍යම ප්‍රදේශයන් ඇති ජනශූන්‍ය වූ මේ වන මධ්‍යයෙහි ගල් කඳුරැළිය අස නහා ගොඩ නැගි බව හේතුකොට ගෙන පවනඹල පල්ලව පත්‍රයක් මෙන් වලිතවම් ඇතිව උදකලාව මෙතැන්හි සිටිනාවූ තොප කවරෙක්හි ද මා විසින් විචාරණලද ස්ත්‍රිය තායේ නාම ගෝත්‍රාදද බන්ධුද නොවලහා ඇති සැටිම කියව. සිංහ ව්‍යාඝ්‍රයන්ගෙන් ගැවසි ගත් මේ වනප්‍රදේශයන් ස්වර්ණ රසධාරාවෙන් තවරණ කලක් පරිද්දෙදන් හාත්පසින් බබුලුවමින් සිටියාවු තිට නමස්කාර කෙරෙමි දානව රාක්ෂසව සිටි මා කළාවු නමස්කාරය තිට වේවයි තී කවරෙක්දැයි කියේය.'

(පන්සියපනස් ජාතක පොත - සම්බුලා ජාතකය)

(ලකුණු 28 යි)

2. "ගුරුළුගෝමීන්ගේ වර්ණනාවන්හි වැඩි ඉඩක් හිමි ව ඇත්තේ අතිශයෝක්තියට නොව ඖචිත්‍යයට ය." මේ අදහස <u>අමාවතුර</u> ඇසුරෙන් විමසන්න.

3. අවස්ථා නිරූපණයෙහි ලා විද්‍යාචක්‍රවර්තීන් විසින් <u>බුත්සරණෙහි</u> භාවිතා කරන ලද රචනෝපක්‍රම සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

4. <u>පූජාවලියේ</u> උපයුක්ත රචනා රීතියෙහි දක්නට ඇති විශේෂතා විමර්ශනය කරන්න.

5. "වෘත්තගන්ධී ශෛලියෙන් රචිත <u>දළදා සිරිත</u> අගනා වංසකථා කාව්‍යයකි." ඔබේ අදහස් දක්වන්න.

6. ධර්මසේන හිමියන්ගේ කථා කලාවෙහි පැනෙන විශේෂත්වය පැහැදිලි කරන්න.

7. "ජාතකකථා කතුවරයා සැම ජාතක කථාවකින් ම පාහේ කිසියම් සනාතන දහමක් ප්‍රකාශ කිරීමට උත්සුක වී ඇත." නිර්දේශිත ජාතක කථා ඇසුරින් විග්‍රහ කරන්න.

(02-07 පිළිතුරු සඳහා ලකුණු 13 බැගිනි )

@@@@@@@@@@@@@@@@@



218